
10

# ගැමි සීපද



රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද  
පැණි මීයේ කෑ මුත් බඩගිනි නැද්ද  
මිණිබරණින් සැදූ මුත් ගත නො දිරද්ද  
පැණි වරකා ගසටත් හෙණ නො වදිද්ද

නහින දෙහින කාලෙට පින් කෙරුම යුත  
වහින කලට කුරින් විල්වලින් එත  
බහින දියෙන් දෝතක් මුත් ගතොත් ඇත  
පනින රිළවුන්ට ඉනිමං කමක් නැත

ගසට කෙටුම ගස මුල පෑයුමෙන් දැනේ  
මිනිහා නොමිනිහා යන කඩිසරෙන් දැනේ  
අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ  
හානා හීය පානා අඬහැරෙන් දැනේ

අඳුරු කරුවලේ පඳුරට මුවා වෙලා  
විදුලි එළිය දැක ගිනිහුළ දියේ හෙලා  
අනුන් ලියන් දැක තම ලියට තළා තළා  
දුවන මුවන් දැක නොදමව් නෙළු පළා

**පැහැදිලි කිරීම් :**

| | |
|---|---|
| රන් විමනේ | රනින් කළ මාලිගාවේ |
| මිණි බරණින් | මැණික් ආභරණවලින් |
| ගත | ශරීරය |
| කුරින් | මාළුවන් |
| පැයුමෙන් | පෑදීමෙන්, ශුද්ධ කිරීමෙන් |
| අඬහැරෙන් | සීසාන විට හරකුන් මෙහෙයීම සඳහා කරන ශබ්දය |
| අමුතු බත් දීම | ආගන්තුකයන්ට ආහාර දීම |
| ගිනිහුළ | ගිනි දල්වූ පොල්කොළ මිටිය / පොල් හනස්ස |
| ලියන් | කාන්තාවන් |

## ක්‍රියාකාරකම්

01). මෙම පැදි පෙළ තනි තනි ව හා සාමූහික ව ගායනා කරන්න.

02). i යම් විපතක් උතුමන්හට වුව ද සිදුවන බව මෙහි දක්වන්නේ කවරාකාරයෙන් ද යි පවසන්න.

ii ඉවත යන දෙයින් ටිකක් ගත්තත් හොඳ බව පෙන්වා දී ඇත්තේ කෙසේ ද ?

iii "පතිත රිළවුන්ට ඉණිමං කමක් නැත" මෙහි අදහස කියන්න.

iv මිනිසකුගේ වැඩ අනුව ඔහු හඳුනාගත හැකි බව කවියා පවසන්නේ කෙසේ ද?

v “දුවන මුවන් දැක නොදමව් නෙළු පලා” මෙයින් කුමක් අදහස් වෙයි ද?

vi මෙහි උපහාසය දනවෙන කවියක් උපුටා දක්වන්න. ඒ ගැන ඔබේ අදහස කියන්න.

03). පහත සඳහන් පැදි පේළිවල අදහස පැහැදිලි කරන්න.

i ගසට කෙටුම ගස මුල පැයුමෙන් දැනේ.

ii අමුතු බත් දීම අත ඇල්ලුමෙන් දැනේ.

iii මිණිබරණින් සැදූ මුත් ගත නො දිරද්ද?

iv අනුන් ලියන් දැක තම ලියට තළ තළා.

**භාෂා භාවිතය**

01). මේ වැකි කියවා බලන්න. මෙහි ඉරි ඇඳි පද පැහැදිලි කරන්න.

i නගරයේ පැවති වාහන තදබදය නිසා රියපෙළ ඉදිරියට ඇදී ගියේ ගොළුබෙලි ගමනෙනි.

ii සේන තනතුරෙන් උසස් වූයේ ඉහළ නිලධාරීන්ට පන්දම් ඇල්ලීමෙනි.

iii පෙරහැරේ ගමන් කළ ඇතා කුලප්පු වීමෙන් අන්දුන් කුන්දුන් වූ ජනයා හිස් ලූ ලූ අත දිව ගියහ.

iv තද මසුරෙකු වූ ඔහුගෙන් උදවු ලබා ගැනීම ගලෙන් පට්ටයක් ලබා ගැනීම වැනි දෙයකි.

ඉහත සඳහන් වාක්‍යවල ඉරිඇඳි පදවලින් දක්වෙන්නේ කතාබහේ දී හෝ ලිවීමේ දී කියන අදහස වඩාත් පැහැදිලි ව දක්වීමට යොදු ගන්නා භාෂා යෙදුම් කිහිපයකි. මේවා රූඪී ලෙස හැඳින්වේ.

පහත දැක්වෙන්නේ එබඳු රූඪී කිහිපයකි.

i කත් අදිනවා. (වහලෙකු ලෙස කටයුතු කිරීම.)
ii සායම ගියා. (කීර්තියට හානි වීම.)
iii හිසේ මලක් පිපුණා. (මහත් සතුටට පත් වීම.)
iv අකුල් හෙළනවා. (බාධා කිරීම.)

02). පහත 'අ' තීරයේ දක්වා ඇති වාක්‍යවල ඉරි ඇඳි පදයේ අදහස දැක්වෙන පාඨ 'ආ' තීරුවෙන් සොයන්න.

| අ | ආ |
|---|---|
| i අම්මා ගෙදර පැමිණියේ නා කපන වැස්ස පවතිද්දී ය. | නින්ද ගෙන දෙන්නක් |
| ii ඔහුට ගණන් සෑදීම කජු කන්නා වාගේ වැඩකි. | මහත් පිපාසයෙන් පෙළීමක් |
| iii අක්කාගේ නුසුදුසු විවාහය පවුලේ කාගේත් මුණේ දැලි ගෑමක් වැනි විය. | තද වැස්ස |
| iv මා ගෙට ගොඩ වූ විගස දිය බඳුන කරා දිව ගියේ දිව ගිලෙන්නට ආවාක් මෙන් වූ නිසා ය. | පළිගැනීම |
| v පියාගෙන් වූ වරද නිසා ගම්මුන් දරුවන්ට ද හිංසා කිරීම කෝන්තර පිරිමැසීමක් බඳු විය. | ඉතා පහසු |

03). **අ.** පහත දක්වා ඇති රූඩිවල අදහස පැහැදිලි වන පරිදි වාක්‍ය සාදන්න.

- i ආ පයින් යනවා
- ii දහදුක් විඳිනවා
- iii වැල්වටාරම්
- iv තිත්ත වුණා
- v තරු විසිවුණා

**ආ.** පැදි පෙළෙහි සඳහන් මෙබඳු රූඩි සොයා ලියන්න.

**කියමන්**

i. රයිගමයයි ගම්පොළයයි වාගේ. (මොන ම හේතුවක් නිසාවත් වෙන් නොවන යාළුවෝ.)

ii. බීරි අලියාට වීණා ගායනා කරනවා වගේ. (අවවාදයෙන් ප්‍රයෝජනයක් නොගන්නෙකුට අවවාද දීම.)

iii. ජාඩියට මූඩිය වගේ. (මනා ගැළපීම.)

මෙබඳු කියමන් ප්‍රස්තාව පිරුළු නමින් හැඳින්වේ.

පහත දැක්වෙන්නේ මෙබඳු ප්‍රස්තාව පිරුළු යෙදී ඇති වාක්‍ය කිහිපයකි.

i. ගංවතුරෙන් විනාශයට පත් වූ ඔවුන්ගේ දේපළ සොර සතුරන් පැහැර ගැනීම ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නාක් වාගේ වීමකි.

ii. ඔහු තමාට අවශ්‍ය එම කාර්යය සුළු සේවකයා ලවා ඉටු කරවා ගත්තේ බළලුන් ලවා කොස් ඇට බාවන්නා සේ ය.

iii. සේන අල්ලස් චෝදනාවට වරදකරු වූ බව දැනගත් ගැමියෝ ගින්නක් නැති ව දුමක් නොනඟී යැයි කීහ.

iv. අසල්වාසීන්ගේ උපකාරයෙන් දියුණුවට පත් ඔහු උසස් නිලධාරින්ට ස්තුති කිරීම ගඟෙන් දිය බී මුහුදට ආවඩන්නාක් වැනි විය.

04). පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවල හිස්තැනට ගැළපෙන පදය රවුමෙන් තෝරා ගෙන ලියන්න.

i. ඇවිළෙන ගින්නට ............................................... දමනවා වාගෙයි.
ii. මිටි තැනින් ............................................... ගලා යන්නා වාගෙයි.
iii. අළු යට සැඟවුණු ............................................... වාගෙයි.
iv. මඩෙහි සිට වූ ............................................... වාගෙයි.
v. ගලේ කෙටූ ............................................... වාගෙයි.



05). පහත **අ** කොටසේ සඳහන් අදහස කියැවෙන ප්‍රස්තාව පිරුළු **ආ** කොටසෙන් තෝරන්න.

| අ | ආ |
|---|---|
| i උදව් ලැබීමට ගිය අයගෙන් ම හිරිහැර පැමිණෙන කල | කටුස්සාගේ කරේ රත්තරන් බැන්ද වගේ |
| ii ඇසූ දේ තිබිය දී අනෙකක් පවසන කල | පනින්ට පෙර සිතා බලනු. |
| iii පහත් කෙනෙකු සුළු දෙයක් ලැබීමෙන් උඩගු ව සිටින කල | පරංගියා කෝට්ටේ ගියා වගේ. |
| iv යා යුතු කෙටි මඟ තිබිය දී දුර මඟකින් යාම. | යන්නෙ කොහෙ ද මල්ලෙ පොල්. |
| v යමක් කිරීමට පෙර විමසා බැලීම යහපත් බව. | වඳින්න ගිය දේවාලේ හිසේ කඩා වැටුණා වාගේ. |

06). පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු යොදා වාක්‍ය සාදන්න.

i කපන්න බැරි අත සිඹින්නා වගේ.
ii දියේ ඇඳි ඉරක් වගේ.
iii ගහෙන් වැටුණු මිනිසාට ගොනා ඇන්නා වගේ.
iv වක්කඩේ හකුරු හැංගුවා වගේ.
v අහසට ඉණිමං බඳිනවා වගේ.

07). පන්තිය කණ්ඩායම්ගත වී රුචි හා ප්‍රස්තාව පිරුළු එකතු කොට කුඩා පොතක් සාද ඉදිරිපත් කරන්න.

08). අතිරේක කියවීම්

## අඹ යාළුවෝ

ස්ථානය : ආපන ශාලාවක්

වේලාව : තේ පානයෙන් පසු

චරිත : යාළුවෝ තිදෙන මුදලාලි කොලුවා

**1 යාළුවා** : කොලු මෙහෙ බලාපන්
අපේ මේ තේ ගණන
කීයදැයි කියාපන්

**කොලුවා** : දෙකයි හැත්තෑ පහයි
**1 යාළුවා** : ආ සල්ලි අරගනින්
**2 යාළුවා** : එපා කොලුවෝ, සල්ලි
එපා ඔහුගෙන් ගන්න
තේ බොන්න ඒ අයට
කතා කෙරුවේ මමයි
ඒ නිසා තේ ගණන
ගෙවිය යුත්තේ මමයි
මේ සල්ලි ගෙන මගෙන්
තේ ගණන අරගනින්

**3 යාළුවා** : හැම දා ම උඹලා ම
ගෙවුවා ම හරි යයි ද?
මටත් එක දිනක්වත්
ගෙවන්නට ඉඩ නැද්ද?
අද ගෙවන්නේ මමයි
ගණන කීයද කොලු?

**කොලුවා** : දෙකයි හැත්තෑ පහයි

**3 යාළුවා** : ආ, ඉඳා අරගනින්

**1 යාළුවා** : එහෙත් ගන්නට එපා
මේ මගෙන් අරගනින්

**2 යාළුවා** : සල්ලි දෙන්නේ කවුද
කියන එක එහෙම නම්
උපායක් මඟින් අපි
සොයා තෝරා ගනිමු
මෙන්න මේ රෙදි කඩින්
කොලුගේ ඇස් බඳිමු
ඊට පසු උඹට අපෙ
අල්ලන්න යැයි කියමු
පළමුවෙන් ඔහුට අසු
වූ තැනැත්තා තමයි
තේ ගණන ගෙවිය යුතු
එය හොඳ ද?

**1 යාළුවා** : හා, හොඳයි

**2 යාළුවා** : හා, හොඳයි

**කොලුවා** : ඔව්, හොඳයි

**3 යාළුවා** : දෑස බැන්දා ඉතින්
කොලු අප අල්ලපන්

කොලූ පැන යාළුවන්
අල්ලන්න තැත් කරයි
යාළුවෝ ඔහුට අසු
නොවන සේ මග හරිත්
ඔවුන්ගේ ඇඟ වැදී
හෝටලේ මේස පුටු
ඇද වැටෙයි හඬ නඟා
පිඟන් වීදුරු බිඳෙයි
හඃ හඃ හා! හිඃ හිඃ හීඃ
දඩ බඩස්! ජර බරස්!
මේ මහා ගෝසාව
ඇසී මුදලාලි එයි

**මුදලාලි** : මොකද බොල කරදරේ?
මොකද මේ කරදරේ?
කොලූ පැන මුදලාලි
තර ව අල්ලා ගනී

**කොලුවා** : අහු වුණා අහු වුණා
අන්තිමේ අහු වුණා
දැන් ඉතින් තේ ගණන
තමුසේ ම ගෙවනවා!

(මහගම සේකර)